රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි අංක:191

මගේ අංකය:140එල්104වි.
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය, කොළඹ 7.
1981 ජූනි මස 09 වැනි දින.

සියළුම ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

<u>රජයේ වාහන පිළිබඳව සැලකිලිමත් වීම හා නඩත්තු කිරීම.</u>

රජයේ වාහන පිළිබඳව නිසි පරිදි සැලකිල්ලක් දැක්වීම හා ඒවා නඩත්තු කිරීම ගැන සඵල ක්‍රියා මාර්ගයක් නැතිවීම ගරු ඇමතිතුමාට බලවත් ප්‍රශ්නයක් වී ඇති බව නියෝග පරිදි දන්වනු කැමැත්තෙමි.

2. බොහෝ අවස්ථාවලදී ඩිස්ටිල්ඩ් ජලය, එන්ජින් තෙල්, රේඩියේටරයට ජලය දැමීම වැනි මූලික, සරල අවශ්‍යතා පවා සපුරා නැති බව ද, එමගින් වාහනවලට බලවත් හානි සිදුවී ඇති බව ද දක්නට ලැබී ඇත.

3. එමනිසා, රජයේ වාහන පිළිබඳව නිසි පරිදි සැලකිල්ලක් දැක්වීම හා ඒවා නිසි පරිදි නඩත්තු කිරීම ගැන හැකිතාක්දුරට පුද්ගලිකව වගබලා ගන්නා ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානීන්, අංශ ප්‍රධානීන්, උප කාර්යාල ප්‍රධානීන්, ප්‍රවාහන කටයුතු පිළිබඳ නිලධාරීන් ආදීන්ට එකාව නියෝග නිකුත් කරන මෙන්, අණ පරිදි, කරුණාවෙන් ඉල්ලා සිටිමි.

4. හැකිතාක් දුරට යම්කිසි වාහනයක් යම්කිසි නිශ්චිත රියැදුරෙකුට භාර දීමද මේ පරමාර්ථය ඉටු කර ගැනීමට බොහෝසෙයින්ම ඉවහල් වේයයි සලකනු ලැබේ.

5. ~~ඔබ අමාත්‍යාංශය යටතේ ඇති රජයේ සංස්ථා ප්‍රධානීන්ට~~ ද මෙවැනිම උපදෙස් නිකුත් කරන මෙන්, අණ පරිදි, කරුණාවෙන් ඉල්ලා සිටිමි.

Siriwardhana

(ඩී.බී.අයි.පී.එස්.සිරිවර්ධන.)
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්.

සී/01